# හානිපූරණය

**අයිතිය ලියාපදිංචිකිරීමේ කාර්ය සඳහා ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම (KYC) සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් ලිපිලේඛන අත්පතනය කිරීම තුළින් උපචිත වන ඩයලොග් ඇක්සියාටා පීඑල්සී (සමාගම) ආයතනයට එරෙහිවවූ යම් හිමිකම්පෑම් වෙනුවෙන් ගනුදෙනුකරු විසින් මෙම හානිපූරණය ඉදිරිපත් කර සිටිනු ලැබේ.**

KYC වෙනුවෙන් ලබාදීමට නියමිත ලිපිලේඛන ඉදිරිපත් කිරීමේදී සහ අයිතිවාසිකම් ක්‍රියාවලිය ලියාපදිංචි කිරීමේදී, (අදාල වන පරිදි) පෙර ගෙවීම්/ පසුගෙවීම් සම්බන්ධතාවය (සම්බන්ධතාවය) මා විසින් දැනට හිමිකාරත්වය දරන බවත් භාවිත කරනු ලබන බවත් ආරම්භයේ සිට අද දිනය දක්වා එම සම්බන්ධතාවය සඳහා මා විසින් හිමිකාරත්වය දරා ඇති බවත් එම සම්බන්ධතාවය ප්‍රයෝජනයට ගෙන ඇති බවත් මා විසින් මෙයින් ප්‍රකාශ කර සිටිමි. තවද එම සම්බන්ධතාවය මා විසින් තවදුරටත් හිමිකාරත්වය දරමින් භාවිත කරනු ලබන බවද මා විසින් තහවුරු කර සිටිමි. තවද මාගේ විස්තර සමගින් සමාගමේ වාර්තා යාවත්කාලීන කරන ලෙසද එකී සම්බන්ධතාවයේ ලියාපදිංචි අයිතිකරු වශයෙන් මා ඇතුළත් කරන ලෙසද මා විසින් මෙයින් සමාගම වෙත දන්වා සිටිනු ලැබේ.

සමාගම විසින් සම්බන්ධතාවයේ හිමිකාරත්වය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් යම් තුන්වන පාර්ශවයක් විසින් ඇතිකරන ඕනෑම ආකාරයක ආරවුලක්/ හිමිකම්පෑමක් සම්බන්ධයෙන් සමාගම වගකීමට යටත් නොවන බවට මම එකඟව සිටිමි.

සමාගම විසින් සම්බන්ධතාවයේ හිමිකාරත්වය ලියාපදිංචි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් හෝ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් විසින් විඳිනු ලැබිය හැකි ඕනෑම ආකාරයක හෝ ස්වභාවයක සියලු පාඩු, පිරිවැය, අලාභ සහ වියදම් මෙන්ම වගකීම් සහ/හෝ අනර්ථවලින් සහ ඒවාට එරෙහිව සමාගම සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභින් හානිපූරණය කර අගතිවිරහිතව නිදහස් කර තැබීමට මා විසින් තවදුරටත් එකඟවී බැඳී සිටිනු ලැබේ.